Ambasciata d'Italia
Colombo

# VISA APPLICATION SUBMISSION APPOINTMENTS

**14th October – 25th October**

Following the cancellation of Visa Appointments taken through middlemen and brokers, new VISA APPOINTMENTS slots for the period **14th October – 25th October** are now AVAILABLE online on the VFS Colombo website (https://visa.vfsglobal.com/lka/en/ita/book-an-appointment).

Appointments must be booked by the applicant WITHOUT resorting to any kind of illicit intermediation, which is highly detrimental to the accessibility of the services to all. In order to fight illicit intermediation, appointments must be booked with the credit card of the applicant/inviting party in Italy. Multiple bookings from the same email address or credit card (except for families and business delegations) will be cancelled and the slots uploaded online once again for genuine applicants. Please note that while booking an appointment applicant must enter the exact and correct passport number and applicant details. Appointments booked with wrong passport number or ID card in the place of the passport number will be cancelled."

# වීසා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ කාල කොටස් වෙන්කරවා ගැනීම

**ඔක්තෝබර් 14 – ඔක්තෝබර් 25**

අතරමැදියන් සහ තැරැව්කරුවන් හරහා ලබාගත් වීසා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල කොටස් අවලංගු කිරීමෙන් පසුව, **ඔක්තෝබර් 14 – ඔක්තෝබර් 25** දක්වා කාලය සඳහා වීසා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ වේලාවන් නැවතත් VFS Colombo වෙබ් අඩවියෙන් දැන් මාර්ගගතව වෙන්කරවා ගැනීමට තිබේ. (https://visa.vfsglobal.com/lka/en/ita/book-an-appointment)

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වේලාවන්, කිසි ආකාරයක නීතිවිරෝධී මැදිහත්වීමකට යොමු නොවී, අයදුම්කරු විසින්ම වෙන්කරවා ගත යුතුය, නීතිවිරෝධී මැදිහත්වීම් සියල්ලන්ටම සේවාවන් ලබා ගැනීමේ හැකියාවට බෙහෙවින් අහිතකර ය.

නීතිවිරෝධී මැදිහත්වීම් වලට එරෙහිව සටන් කිරීම සඳහා, අයදුම්කරුගේ හෝ ඉතාලියේ ආරාධිත පාර්ශ්වයේ ක්‍රෙඩිට් කාඩ්පත සමඟ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල පරතරය වෙන්කරවා ගත යුතුය.   එකම විද්‍යුත් තැපැල් ලිපිනයෙන් හෝ ක්‍රෙඩිට් කාඩ්පතෙන් (පවුල් සහ ව්‍යාපාරික නියෝජිතයින් හැර) බහු කාල වෙන් කිරීම් අවලංගු කෙරෙන අතර, සැබෑ අයදුම්කරුවන් සඳහා නැවත වරක් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල පරාසයන් ලබා දෙනු ඇත.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල පරතරයක් වෙන්කරවා ගැනීමේදී, අයදුම්කරුවන් නිශ්චිත සහ නිවැරදි ගමන් බලපත්‍ර අංකය සහ අයදුම්කරුගේ විස්තර ඇතුළත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.   වැරදි විදේශ ගමන් බලපත්‍ර අංකයෙන් හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය වෙනුවට හැඳුනුම්පත් අංකයෙන් වෙන් කර ඇති අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල කොටස් අවලංගු කරනු ලැබේ.